# සෝමලතා සුබසිංහ ළමා නාට්‍ය නිර්මාණයේ දී වස්තු විෂය තෝරා ගැනීම සහ එය නිර්මාණශීලීව ඉදිරිපත් කිරීම සම්බන්ධව දක්වා තිබෙන ශක්‍යතා පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක් (පුංචි අපට දැන් තේරෙයි ළමා නාට්‍යය ඇසුරෙන්)

පී. ඒ. එස්. එස්. කෞෂල්‍යා
කැලණිය විශ්වවිද්‍යාලය
passkaushalya@gmail.com

**සාරසංක්ෂේපය**

ළමා නාට්‍ය නිර්මාණයේ ප්‍රමුඛස්ථානය ගන්නා සෝමලතා සුබසිංහ, සීමිත වුවත් හරවත් ළමා නාට්‍ය සමූහයක් බිහි කරන්නට සමත් වූ තැනැත්තියකි. වස්තු විෂය තෝරා ගැනීම සහ නිර්මාණශීලීව ඉදිරිපත් කිරීම සම්බන්ධව සුබසිංහ දැක්වූ කුසලතාව ළමා නාට්‍ය පිටපත් සාර්ථක ව ඉදිරිපත් කරන්නට බලපා ඇතැයි අධ්‍යයනය කළ හැකි වේ. ළමා මනස වෙත සමීප වීමේ දී අන්‍ය රටකට ආවේණික වස්තු විෂයක් වුවත් ලාංකේය සමාජයේ දරුවාට යෝග්‍ය ආකාරයෙන් සම්පාදනය කරමින් නිර්මාණශීලීව ඉදිරිපත් කර ඇත්තේ කෙසේ ද යන්න සොයා බැලීම පර්යේෂණ ගැටලුවයි. මනෝවිද්‍යාත්මකව ළමා මනස හඳුනා ගනිමින් ඊට උචිත පරිදි නිර්මාණශීලී ව නාට්‍යය නිර්මාණය කර තිබේ ද යන්න ගවේෂණය කිරීම මෙම පර්යේෂණයේ අරමුණ වේ. එහිදී මුඛ්‍ය මූලාශ්‍රය වශයෙන් සුබසිංහගේ **පුංචි අපට දැන් තේරෙයි** නාට්‍ය පිටපත සහ එයට පදනම් වන ජනකතාව අධ්‍යයනය කෙරිණි. මෙහිදී ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය යටතේ පුස්තකාල නිරීක්ෂණය සහ ශාස්ත්‍රීය ලිපි, පර්යේෂණ නිබන්ධන ආශ්‍රය කෙරිණි. ක්ෂේත්‍රයේ ප්‍රාමාණික උගතුන් හමු වී සම්මුඛ සාකච්ඡා ආශ්‍රයෙන් ද තොරතුරු එක් රැස් කෙරිණි. නිර්මාණයක නිර්මාණශීලී බව තීරණය වීම සම්බන්ධ ව වස්තු විෂය ප්‍රබලව බලපෑම් කරන්නෙකි. නාට්‍ය පිටපත සම්බන්ධව ද එසේම ය. තමා නාට්‍යය ඉදිරිපත් කරන්නට බලාපොරොත්තු වන පිරිසේ ස්වභාවය අනුව වස්තු විෂය තෝරා ගැනීම දක්ෂ නිර්මාණකරුවෙකුගේ ලක්ෂණයකි. සුබසිංහ එය ජය ගන්නට සමත් වී ඇති බව මෙම නාට්‍ය පිටපතෙන් පෙනී යන්නෙකි. ළමයා යනු කවරෙක් ද? ළමා මනසට යම් අදහසක් ඉදිරිපත් කිරීමේ දී ආමන්ත්‍රණය කරන්නට වඩාත් උචිත ක්‍රමවේදය කුමක් ද? යන්නට සුබසිංහ දැන සිටි බව නාට්‍ය පිටපත අධ්‍යයනයෙන් මෙන් ම දර්ශන අධ්‍යයනයෙන් ද නිගමනය කළ හැකි වේ. **පුංචි අපට දැන් තේරෙයි** ළමා නාට්‍යය නිර්මාණයට යොදාගත් වස්තු විෂයීය ජනකතාව දරුවාට විවිධාකාරයෙන් අසන්නට දකින්නට ලැබුණ ද, සුබසිංහ තම නාට්‍යය නිර්මාණයේ දී වස්තු විෂය වඩාත් නිර්මාණශීලී, කලාත්මක, උපදේශනාත්මක සහ අධ්‍යාපනික දැනුමකින් පෝෂණය කරමින් ජනකතාවට සාපේක්ෂව නව්‍යත්වයකින් යුතුව ඉදිරිපත් කරන්නට සමත් වී ඇති බව නිගමනය කළ හැකි වේ. වස්තු විෂය නාට්‍යකරණයට නිර්මාණශීලී ව ඒකාබද්ධ කරගැනීමෙන් ළමා මනසට රසවින්දනය මෙන් ම ප්‍රඥාව ද නිර්මාණශීලී ව සමීප කළ හැකි බව මෙම නාට්‍යයෙන් නිරීක්ෂණය වේ.

**ප්‍රමුඛ පදඃ** අධ්‍යාපනය, නාට්‍ය, පුංචි අපට දැන් තේරෙයි නාට්‍යය, වස්තු විෂය, ළමා රසවින්දනය

# An Investigative Study of Somalatha Subasinghe's Ability to Choose the Subject Matter and Present it Creatively in Creating Children's Dramas (Based on the Children's Play "Punchi Apata Den Therei")

P. A. S. S. Kaushalya
University of kelaniya
passkaushalya@gmail.com

**Abstract**

Somalatha Subasinghe, who takes the lead in creating children's drama, is a person who has managed to create a group of valuable children's drama scripts even though she is limited. It can be studied that Subasinghe's skill in choosing the subject matter and presenting it creatively has influenced the successful presentation of children's drama scripts. The research problem is to find out how the subject matter belonging to another country has been creatively presented in a suitable way for the child in Sri Lankan society. The aim of this research is to explore whether the play has been created appropriately by recognising the child's mind on a psychological aspect. There, as the main sources, Subasinghe's play script "Punchi Apata den Therei" and the folktale based on it were studied. Library observation, academic articles and research theses were consulted under qualitative research methodology. Information was also collected through interviews with authentic experts in the field. The subject matter is a strong influencer in determining the creativity of a creation. The same is true for the script. It is a characteristic of a skilled creator to choose the subject according to the nature of the people he hopes to present the play to. It is clear from this drama script that Subasinghe has managed to overcome it. It can be concluded from the study of the play script as well as from the study of the scenes that Subasinghe knew who the child was and the most appropriate method to address the child's mind in presenting a certain idea. Although the child gets to hear and see the folktale used in the creation of the children's drama "Punchi Apata den Therei", it is concluded that Subasinghe has managed to present the subject matter with more creative, artistic, instructional and educational knowledge in the compilation of her creation of the drama with an innovation compared to the folktale. It is observed from this drama that by creatively integrating the subject matter into dramatisation, the child's mind can be creatively approached with enjoyment as well as wisdom.

**Keywords:** Children's enjoyment, Drama, Education, Subject matter, The drama "Punchi Apata Den Therei"